# අනුලා විද්‍යාලය-නුගේගොඩ

**ගණිතය - 10 ශ්‍රේණිය - 1 වන වාර පරීක්ෂණය (කාලය මි.45 යි)**

**I කොටස**

ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. 2015

නම-.................................................................................................................................

**01.** $2.73 + 29.8$ හි අගය සොයන්න.

**02.** කේන්ද්‍රික කෝණය $40°$ වූ කේන්ද්‍රික ඛණ්ඩයක් වෘත්තයකින් කවර භාගයක් ද?

**03.** එක්තරා පූර්ණ සංඛ්‍යාවක පලමු සන්නිකර්ෂණයට වර්ගමූලය $8.2$ විය. එම සංඛ්‍යාව කුමක්ද?

**04.** පහත රූපයේ $x$ මගින් දැක්වෙන කෝණයෙහි අගය සොයන්න.




**05.** $(n + 4)(2n - 1)$ සුළු කරන්න.

**06.** පහත සෘජුකෝණික ත්‍රිකෝණ කුමන අංගසම අවස්ථාව යටතේ අංගසම වේ ද?



**07.** $12, 18$ යන සංඛ්‍යා වල කු.පො.ගු. සොයන්න.

**08.** $13, 24, 7, 12, 24$ යන සංඛ්‍යා වල මධ්‍යස්ථය කුමක්ද?

**09.** $70°$ හි පරිපූරකය කුමක්ද?

**10.** 1.5 න් $\frac{2}{3}$ කොපමණද?

**11.** $ax = bx + 3$ සූත්‍රයෙහි $x$ උක්ත කරන්න.

**12.** 12 හි සාධක සියල්ල ලියන්න.

**13.** $\varepsilon = $ {අපේ පන්තියේ සිටින ළමයින්}, $A = $ {අපේ පන්තියේ සිටින චිත්‍ර හදාරනන්} නම් $A'$ කුලකය ලියන්න.

**14.** බැංකු ගිණුමක රු. 50 000 ක් ඇති අයෙකුට එක් මසක පොලිය ලෙස රු. 200 ක් ලැබුණි. මසකට රු.500 ක පොලියක් ලබාගැනීමට කොපමණ මුදලක් ගිණුමෙහි තිබිය යුතු ද?

**15.** $0.3 \times 0.2$ හි අගය සොයන්න.

**16.** $x$ නම් සංඛ්‍යාවට තුනක් එකතුකර දෙකෙන් බෙදූ විට ලැබෙන ප්‍රතිඵලය $x$ ඇසුරෙන් ලියන්න.

**17.** සුළු කරන්න. $\dfrac{6a^2 \times a^4}{2a^{-1}}$

**18.** මුදලකින් $\frac{3}{8}$ ක් රු. 1200 කි. එම මුදල කොපමණද?

**19.** 18, 24 යන සංඛ්‍යා වල ම.පො.සා. සොයන්න.

**20.** 5, 8, 12, 17, 23 රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

# අනුලා විද්‍යාලය-නුගේගොඩ

**ගණිතය** - 10 ශ්‍රේණිය - 1 වන වාර පරීක්ෂණය (කාලය පැය 1 යි මි 15 යි)

**II කොටස**

ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.

නම-.............................................................................................................

**01.** "ත්‍රිකෝණයක පාද තුන තවත් ත්‍රිකෝණයක පාද තුනට සමාන වන්නේ නම්, එම ත්‍රිකෝණ යුගලය අංගසම වේ."

*i.* ත්‍රිකොණ දෙකක් අංගසම වීමේ වෙනත් අවස්ථාවක් ඉහත ආකාරයට ලියන්න.

*ii.*




රූපයේ $ED = CB$ ද $AB = CF$ ද, $AD = EF$ ද වේ.

රූපය පිටපත් කරගෙන ඉහත තොරතුරු එහි ඇතුලත් කරන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

*iii.* ඉහත රූපයේ $ABD$ සහ $CEF$ ත්‍රිකෝණ අංගසම වන බව සාධනය කරන්න.

*iv.* $A\hat{B}D = 30^\circ$ සහ $B\hat{A}D = 40^\circ$ නම්, $C\hat{E}F$ හි අගය සොයන්න.

*v.* $ABC$ හා $PQR$ ත්‍රිකෝණ වල $AB = QR$, $AC = PR$, $A\hat{B}C = P\hat{Q}R$ වේ. එම තොරතුරු සඳහා දළ සටහන් අඳින්න. එම ත්‍රිකෝණ අංගසම වේ ද, නොවේ ද යන්න ලියන්න.

**02.** *i.* පහත එක් එක් වර්ගජ ප්‍රකාශනයෙහි සාධක සොයන්න.

*a)* $x^2 + 7x + 12$

*b)* $m^2 + 2m - 15$

*c)* $3p^2 - 11pq + 6q^2$

*d)* $50x^2 - 18$

*ii.* කමනී සිතූ සංඛ්‍යාව $x$ වේ. නිමල් $x$ ට වැඩි සංඛ්‍යාවක් ද, පාලිත $x$ ට අඩු සංඛ්‍යාවක් ද සිතුවෝය. නිමල් සහ පාලිත සිතූ සංඛ්‍යා දෙකෙහි ගුණිතය $x^2 - x - 30$ විය.

*a)* දී ඇති ප්‍රකාශනයේ සාධක සොයන්න.

*b)* නිමල් සිතූ සංඛ්‍යාව කමනී සිතූ සංඛ්‍යාවට වඩා කොපමණ වැඩි ද?

*c)* පාලිත සිතූ සංඛ්‍යාව කමනී සිතූ සංඛ්‍යාවට වඩා කොපමණ අඩු ද?

**03.** පහත දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රාකාර ඉඩමක් සහ එයට යා වූ අර්ධ වෘත්තාකාර පොකුණක දළ සටහනකි.

*i.* ඉඩමේ වර්ගඵලය 140 $m^2$ සහ පළල $7m$ නම්, ඉඩමෙහි දිග කොපමණ ද?

*ii.* අර්ධ වෘත්තාකාර පොකුණෙහි මතුපිට වර්ගඵලය සොයන්න.

*iii.* අර්ධ වෘත්තාකාර පොකුණෙහි $2m$ උසට ජලය පිරී තිබේ නම්, එහි ඇති ජල පරිමාව කොපමණ ද?

*iv.* ඉඩම පොකුණ සහිත දී ඇති රූපයෙහි පරිමිතිය සොයන්න.



*v.* කේන්ද්‍රික ඛණ්ඩයක අරය 14 $cm$ සහ පරිමිතිය 50 $cm$ නම්, කේන්ද්‍රික කෝණයෙහි අගය සොයන්න.

**04.** *i.* සුදුසු ක්‍රමයක් භාවිතයෙන් $\sqrt{784}$ හි අගය සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

*ii.* $\sqrt{7}$ සඳහා පලමුවන සන්නිකර්ෂණය ලබාගන්න.

*iii.* බෙදීමේ ක්‍රමය (පොදු ක්‍රමය, සාධාරණ ක්‍රමය) භාවිතයෙන් 8.7 හි වර්ගමූලය ආසන්න දෙවන දශමස්ථානයට සොයන්න.

*iv.* ඝනකයක පෘෂ්ඨ වර්ගඵලය 294 $cm^2$ වේ නම්, එහි දාරයක දිග සොයන්න.

**05.** අයෙක් තම ගමනෙන් $\frac{4}{7}$ ක් දුම්රියෙන් ද, ඉතිරියෙන් $\frac{2}{3}$ ක් බසයෙන් ද, ගමන් කර ඉතිරි $5km$ දුර පයින් ගමන්කර ගමන අවසන් කළේ ය.

*i.* දුම්රිය ගමනින් පසු ඉතිරි දුර භාගයක් ලෙස ලියන්න.

*ii.* බසයෙන් ගිය දුර මුළු දුරෙහි භාගයක් ලෙස ලියන්න.

*iii.* දුම්රියෙන් සහ බසයෙන් ගිය මුළු දුර භාගයක් ලෙස ලියන්න.

*iv.* පයින් ගිය දුර මුළු ගමනෙහි භාගයක් ලෙස ලියන්න.

*v.* ගමනෙහි මුළු දුර කොපමණ ද?

*vi.* $\frac{2}{3} \div 1\frac{5}{9} + \frac{1}{3}$ සුළු කරන්න.